# බලය බෙදීමට අප විරුද්ධ ඇයි? - I

සිංහල ජාතික මතවාදය විසින් ඊනියා බලය බෙදීම ප්‍රතික්ෂේප කෙරී ඇත. එය අද ඊයේ කෙරුණක් නොවෙයි. වරින්වර විවිධ මාතෘකා යටතේ පළවී ඇති ලිපි ලේඛන හදාරන්නකුට ඒ බව සක්සුදක් සේ පැහැදිලි නමුත් ඇතැම් කැබිනට් ඇමැතිවරුන්ට ද ඔවුන්ගේ හෙන්චයියන්ට ද තවමත් ඒ බව අවබෝධ නොවීම කනගාටුවට කරුණකි. එබැවින් නැවත නැවත ඒ ගැන කතා කිරීමට සිදුවෙයි.

බලය බෙදීම යන්න ඊනියා ජනවාර්ගික ප්‍රශ්නයකට ඉන්දියාව ගෙන ආ විසඳුමකි. පළමුවෙන්ම කිවයුත්තේ ඉන්දියාවේ මෙන් මෙරට ජනවාර්ගික ප්‍රශ්නයක් නොමැති බවය. ඉන්දියාවේ එකට යාබදව ඇති ප්‍රදේශවල ඒ ඒ ජනවර්ග බහුතරය ජීවත් වෙති. එමෙන්ම ඒ ඒ ජනවර්ගයෙන් අතිවිශාල බහුතරය ජීවත් වන්නේ ද එවැනි එකට යාබදව ඇති ප්‍රදේශවලය. එබැවින් ඒ ප්‍රදේශ ඒ ඒ ජනවර්ගය ජීවත් වන ප්‍රදේශ ලෙස නම් කිරීමේ හැකියාව ඉන්දියාවෙහි තිබේ.

උදාහරණයක් ලෙස අද තමිල්නාඩුව යැයි නම් කෙරී ඇති ප්‍රදේශය එකට යාබදව පවතින ප්‍රදේශයක් පමණක් නොව මුළු ඉන්දියාවේ දෙමළ ජනගහනයෙන් සියයට අනූවක් පමණ ජීවත් වන ප්‍රදේශය ද වෙයි. එමෙන්ම තමිල්නාඩුවේ ජනගහනයෙන් සියයට අනූවට කිට්ටු ප්‍රමාණයක් දෙමළ වෙයි. ඉන්දියාවේ ඒ ඒ ජනවර්ග එනම් ඒ ඒ භාෂාව කතා කරන එමෙන්ම එකම සංස්කෘතියකට හිමිකම් කියන ඒ ඒ ජනවර්ගයක් ගැන සවිඥානිකව හිතන ජන කොටස් එලෙස එකට යාබදව ඇති ප්‍රදේශවල සංකේන්ද්‍රගත වී ඇත. එබැවින් ජනවර්ග අනුව ප්‍රදේශවලට බෙදීමේ හැකියාව ඉන්දියාවේ වෙයි. එහෙත් ලංකාවේ එසේ නොවෙයි. අද වන විට ලංකාවේ ජාතියක් හා ජනවර්ග කිහිපයක් වෙයි. ජාතිය සිංහලය. ජනවර්ග අතර දෙමළ, මුස්ලිම්, මැලේ, හෙට්ටි, බර්ගර් ආදිය වෙයි. එහෙත් සිංහල හැරෙන්නට තරමක විශාල භූමි භාගයක් සංකේන්ද්‍ර වී ඇති ජාතියක් හෝ ජනවර්ගයක් හෝ නැත. යාපනය දිස්ත්‍රික්කයේ දෙමළ ජනයා සංකේන්ද්‍රගත වී ඇති නමුත් ඒ සිංහල ජනයා හා මුස්ලිම් ජනයා ඒ ප්‍රදේශයෙන් පන්නා දැමීමෙන් පසුවය.

නැගෙනහිර පළාතේ කෙසේවත් දෙමළ ජනයා බහුතරය වන්නේ නොවේ. එහි දෙමළ කතා කරන ජනයා බහුතරය විය හැකිය. එහෙත් මුස්ලිම් ජනයා තමන් දෙමළ ජනයා සමග කිසි විටෙකත් එක් ජනවර්ගයක් ලෙස කටයුතු කරන බවට ප්‍රතිඥාවක් දී නැත. මුස්ලිම් ජනයා ද දෙමළ කතා කරන බව සැබෑය. එහෙත් එපමණකින් දෙමළ කතා කරන සියලු ජනයා දෙමළ ජනවර්ගයක් බවට පත් නොවෙයි. දෙමළ කතා කරන ජනයා යනු දෙමළ ජනවර්ගය නොවන බව පැහැදිලි විය යුතුය. ජනවර්ගය හා භාෂාවක් කතාකරන ජනයා අතර විශාල වෙනසක් ඇති බව තේරුම් ගත යුතුව ඇත.

අප නොයෙකුත්වර කියා ඇති කරුණක් නැවතත් කීමට අවස්ථාව එළැඹී ඇත. මෙරට දෙමළ ජනයාගෙන් සියයට හැටක ප්‍රමාණයක් ජීවත්වන්නේ උතුර හා නැගෙනහිර පළාත්වලින් පිටතය. උතුර හා නැගෙනහිර පළාත්වලට බලය බෙදීමෙන් දෙමළ ජනයාට ඇතැයි කියන ඊනියා අසාධාරණවලට පිළිතුරු නොලැබෙන බව ඕනෑම අයකුට තේරුම් ගත හැකිය.

ඉන්දියාව එරට තත්ත්වය අනුව අප රටේ ද තත්ත්වය විග්‍රහ කිරීමට උත්සාහ කළ ද ඒ සාර්ථක වී නැත. ලංකාවට සරිලන ආකෘතියකින් තොරව ප්‍රශ්න තේරුම් ගැනීම නොව තේරුම්ගැනීමට උත්සාහ කිරීමද නිෂ්ඵලය. අප ඉන්දියාවට පැහැදිලිව එහෙත් දැඩි අධිෂ්ඨානයකින් අපේ රටේ ජනසංයුතිය පිළිබඳ කරුණු කියා දිය යුතුය. සාධක සහිතව න්‍යායානුකූලව (තර්කානුකූලව) කරුණු ඉදිරිපත් කළ ද ඉන්දියාව ඒ පිළිගනී යැයි නොසිතිය යුතුය. ඉන්දියාව අනවශ්‍ය ආකාරයෙන් ඒ පිළිබඳ අපට බලපෑම් කළහොත් අපට කරන්නට තිබෙන්නේ එකම එක කරුණක් පමණි. එනම් ඉන්දියාව කියන දෙයට ඇහුම්කන් නොදීමය.

අනෙක් අතට දෙමළ ජනයාට දෙමළ වීම නිසාම සිදුවී ඇති අසාධාරණය කුමක්දැයි ඇසුවිට එයට සරිලන පිළිතුරක් මේ අවස්ථාව වන විටත් කිසිම අයකු විසින් ලබා දී නොමැත. පනස්හයේ සිංහල භාෂාව රාජ්‍ය භාෂාව කිරීම නිසා ප්‍රශ්න ඇති වී යැයි කියන්නන්ට අපි පිළිතුරු දී ඇත්තෙමු. කෙසේ වෙතත් රට බෙදීම සඳහා චෙල්වනායගම් මහතා

© Prof. Nalin De Silva

පිහිටුවාගත් පකෂයෙහි අවශ්‍යතාවක් 1949 දී මෙරට නොවීය. අවුරුදු දෙදහස් ගණනාවක් රාජ්‍ය භාෂාව ලෙස තිබූ භාෂාව නැවත වරක් මෙරට රාජ්‍ය භාෂාව වීමේ ඇති වරද කුමක්ද?

දෙමළ ජනයාට දෙමළවීම නිසාම ඇති වූ ප්‍රශ්නයක් ලෙස ඉදිරිපත් කෙරෙන ඊනියා කළු ජූලිය අපි ද නැවත වරක් සාකච්ඡා කරමු. මෙහිදී කියැවෙන්නේ සිංහල ජාතිකයන් දෙමළ ජනයාට හිරිහැර කළ බවය. ඔවුන් මරණයට පත්කළ බවය. එහෙත් සිංහල ජාතියටම ඊනියා කළු ජූලිය සම්බන්ධයෙන් වරද පටවන මොවුහු දෙමළ ජනයා බේරාගත් ඇතැම් සිංහලයන් ගැන කිසිවක් නොකියති. මේ පඬියන්ට අනුව දෙමළ ජනයාට හිරිහැර කර ඇත්තේ සිංහල ජාතිය ය. එහෙත් ඇතැම් දෙමළ ජනයා බේරාගැනීමට ඉදිරිපත් වූවෝ සිංහල ජනතාවගේ කොටසක් වත් නොවෙති.

එක්කෝ දෙමළ ජනයා නැසුවත් සිංහලයන් කිහිප දෙනෙක් පමණක් විය යුතුය. නැත්නම් දෙමළ ජනයා ආරකෂා කළ අය සිංහල ජාතිය ලෙස සැලකිය යුතුය. පඬියෝ තම කුහකවත අනුව සිංහල ජාතිය දෙමළ ජනයාට විශාල අසාධාරණයක් කර ඇති බව කියති. ඒ අතර දෙමළ ජනයා ආරකෂා කළේ සිංහලයන් කිහිප දෙනෙක් පමණක් බව කියති. දෙමළ ජනයාට හිරිහැර කළ අය අතර සිටි මුස්ලිම් බර්ගර් ආදී ජනවර්ගවලට එරෙහිව ද කිසිවක් කීමට ඔවුහු නොපෙළඹෙති.

දෙමළ ජනයාට හිරිහැර කළවුන් සිංහල ජාතිකයන් පමණක් බව කියන්නන් දෙමළ ජනයාට උදව් උපකාර කළ වුන් සිංහල ජාතියට අයත් අය යැයි කිව යුතුය. ඒ කරුණු ගැන වෙන වෙන අදහස් පළ කරන්නෝ සිංහල ජාතියට පහර ගැසීම සඳහා ඕනෑම සංසිද්ධියක් තමන්ට රිසි අයුරින් ප්‍රයෝජනයට ගන්නා සිංහල බෞද්ධ විරෝධීහු පමණක්ම වෙති. මෙහි ඇති තවත් පරස්පරයක් නම් ඊනියා කළු ජූලියේදී දෙමළ කඩ කැඩූ අය අතර මුස්ලිම් හා වෙනත් ජනවර්ගවලට අයත්වූවන්ද සිටි බවය.

බලය බෙදීම යනු නැති ප්‍රශ්නයකට දී ඇති උත්තරයක් පමණය. ප්‍රශ්නයක් නැති නම් විසඳුමක්ද නැත. ඊනියා ජනවාර්ගික ප්‍රශ්නයක් නැති කල එය විසඳීම සඳහා කරන යෝජනාවලින් වෙනත් ප්‍රශ්නයක් ඇතිවීමට ඉඩ තිබේ. ඊනියා ජනවර්ගය මත පදනම් වී බලය බෙදීමෙන් සිදුවන්නේ කිසි දිනකත් විසඳිය නොහැකි වෙනත් ප්‍රශ්නයක් මතු වීමය.

එසේ නම් කළ යුත්තේ කුමක්ද යන ප්‍රශ්නය නඟනු නොඅනුමානය. පළමුව කළ යුත්තේ ප්‍රශ්නය කුමක්දැයි තේරුම් ගැනීමය. ප්‍රශ්නය ඊනියා ජනවාර්ගික ප්‍රශ්නයක් නොව ඉංග්‍රීසි උගත් දෙමළ ප්‍රභූන්ට 1931 න් පසු ලංකාවේ නායකයන් වීමට නොහැකිවීම පිළිබඳ ප්‍රශ්නය ය. මෙහිදී අප කළ යුත්තේ මේ සුළු පිරිසට පමණක් නොව ඉංග්‍රීසි නොදත් අනෙක් දෙමළ ජනයාට ද ලංකාවේ නායකයන් වීමේ හැකියාව ලබා දීමය.

එහෙත් ඒ හැකියාව නිකම් ලබාදිය හැක්කක් නොවෙයි. ලංකාවේ නායකයන් වන්නන් කළ යුත්තක් ඇත. එනම් ලංකාවේ ප්‍රධාන සංස්කෘතිය සිංහල බෞද්ධ බව පිළිගැනීමය. නායක්කාර වංශිකයන් පමණක් නොව ගිවිසුමකින් රට භාරගත් ඉංග්‍රීසීහුද මෙරට ප්‍රධාන සංස්කෘතිය සිංහල බෞද්ධ සංස්කෘතිය බව පිළිගත්හ. අද ද මෙරට නායකයකු වන්නකුට ඒ බව පිළිගැනීමට සිදුවෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva